# <u>සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024</u>

අංක 2,380 දරන 2024.04.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 විභාග නිවේදනයේ අංක 14.2.1 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

14.2.1 සුදුසුකම් - ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. ඒ අතර,

i. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී ඇති නිලධාරීහු සහ

ii. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති එහෙත් අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරීහු ද මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.

සටහන - පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර සේවයේ ස්ථිර කරන ලද, වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නමුත් පරිපාලන කරුණු හේතුවෙන් මෙතෙක් II ශ්‍රේණියට උසස් වීම් ලබා නොසිටින ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ට ද මෙම විභාගය සඳහා පෙනී සිටිය හැකි වේ.

02. උක්ත ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් විභාගයෙහි අයදුම්පත් යොමු කළ හැකි **අවසාන දිනය දීර්ඝ කරනු නොලැබේ**. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්හට නැවත අයදුම් කිරීමෙන් වළකින ලෙස දන්වනු ලැබේ.

03. සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 ට අදාළ උක්ත විභාග නිවේදන සංශෝධනය නොපමාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

2024 අප්‍රේල් මස 16 වැනි දින
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.